# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2238/33 - 2021 ජූලි මස 30 වැනි සිකුරාදා - 2021.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**8 වන සංශෝධනය**

ශ්‍රී ලංකා හෙද සේවයේ සේවා ව්‍යවස්ථාව

පහත I කොටසේ සඳහන් පරිදි සංශෝධිත 2013 නොවැම්බර් 19 දිනැති අංක 1837/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහය, පහත II කොටසේ දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021 ජූලි මස 29 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 1 - 2014 සැප්තැම්බර් 23 දිනැති අංක 1881/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 2 - 2016 මැයි 11 දිනැති අංක 1966/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 3 - 2016 සැප්තැම්බර් 27 දිනැති අංක 1986/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 4- 2017 ජුනි 07 දිනැති අංක 2022/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 5 - 2018 අගෝස්තු 27 දිනැති අංක 2086/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 6 - 2018 සැප්තැම්බර් 07 දිනැති අංක 2087/75 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 7 - 2020 පෙබරවාරි 25 දිනැති අංක 2164/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*


1A - G 34736 — 21 (2021/07)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## II කොටස

11. 2 **තෝරා ගනු ලබන ක්‍රමවේදය :**

**(අ) (1) ෂ වැනි ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා) තනතුරුවලට පත් කිරීම.**

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 35%ක් පිරවීම සඳහා II ශ්‍රේණියේ, I ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ පහත දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරීන් අතරින් ඉහත 11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලැබේ. විභාගයේ විෂය නිර්දේශය උපලේඛනය iv මගින් දැක්වේ.

(i) පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම.
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
(iiii) අනුමත කාර්ය සාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
(iv) වයස අවුරුදු 48 නොඉක්මවා තිබීම.

ඉතිරි 65%ක පුරප්පාඩු ප්‍රමාණය සඳහා II ශ්‍රේණියේ, I ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ සිටින පහත දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය, කුසලතාවය, යෝග්‍යතාවය, වැඩ හා හැසිරීම අනුව සෞඛ්‍ය ලේකම් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉන් සමත් වන නිලධාරීන් අතුරින් ඉහත 11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබේ. උපලේඛනය v මගින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය දැක්වේ.

(i) පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම,
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම,
(iii) අනුමත කාර්ය සාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
(iv) වයස අවුරුදු 52 නොඉක්මවා තිබීම.

**දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගනු ලබන ක්‍රමවේදය :**

i. එක් එක් දිස්ත්‍රික්කයේ සීමිත හා කුසලතා ධාරාවන් සඳහා වෙන් කරනු ලබන තනතුරු සංඛ්‍යාව සහ එම දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුළත් කර ප්‍රසිද්ධ කරනු ලැබේ.

ii. සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට එක් ධාරාවක් යටතේ උපරිම වශයෙන් දිස්ත්‍රික්ක 03 ක් සඳහා තමාගේ මනාපය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. (දෙවන තුන්වන මනාප සඳහන් කිරීම අනිවාර්ය නොවේ) එම දිස්ත්‍රික්කය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

iii. එක් දිස්ත්‍රික්කයක් සඳහා අයදුම් කර ඇති නිලධාරීන් ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව එම දිස්ත්‍රික්කය සඳහා වෙන් කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සීමිත හා කුසලතා ධාරාවන්ගෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගනු ලැබේ.

iv. යම් දිස්ත්‍රික්කයක් සඳහා කුසලතා ධාරාව යටතේ වන පුරප්පාඩු එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා සුදුසුකම් සහිත නිලධාරියකු නොමැති අවස්ථාවකදී එහි පුරප්පාඩු සංඛ්‍යාව සීමිත ධාරාවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

v. යම් දිස්ත්‍රික්කයක් සඳහා සීමිත ධාරාව යටතේ වන පුරප්පාඩු එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා සුදුසුකම් සහිත නිලධාරියකු නොමැති අවස්ථාවකදී එම පුරප්පාඩු සංඛ්‍යාව කුසලතා ධාරාවෙන් සම්පූර්ණ කරනු ලැබේ.

vi. ඉහත අනු අංක iv හා v අනුව සම්පූර්ණ කළ නොහැකි නම් දිස්ත්‍රික්කයක පවතින පුරප්පාඩු ප්‍රමාණය සීමිත ධාරාව යටතේ විභාගය සමත් ඉතිරි නිලධාරීන්ගේ කුසලතා අනුපිළිවෙල හා මනාපය අනුව සම්පූර්ණ කරනු ලැබේ. ඒ සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේදී සේවය කිරීමට කැමති වෙනත් දිස්ත්‍රික්ක 03ක් සඳහා මනාපය ලබා දීමට නිලධාරීන්ට අවස්ථාව ලබා දෙනු ඇත.

vii. වසර 1 1/2 පුහුණුව සාර්ථකව සම්පූර්ණ කරන නිලධාරීන් සඳහා වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය (මාස 12) පුහුණුව අවසානයේ පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල පදනම් කරගෙන දිස්ත්‍රික් පදනමින් කුසලතා ලේඛනය සකස් කරනු

ලැබේ. එම කුසලතා ලේඛනය පදනම් කරගෙන නිලධාරීන් සෞඛ්‍ය ලේකම් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ලක්කර 11.1.(අ) යටතේ දැක්වෙන සුදුසුකම් සම්පූර්ණ කර තිබේද යන්න පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් තිබෙන බවට නිර්දේශ වන නිලධාරීන්ට එක් එක් දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු අනුව කුසලතා ලේඛනය පදනම් කරගෙන 1 ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට පත්වීම ලබා දෙනු ඇත.

**තෝරා ගන්නා ආකාරය :**

ලිඛිත තරග විභාගය සමත් සීමිත ධාරාව යටතේ වන අයදුම්කරුවන් අතුරින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවය අනුව කුසලතා ධාරාව යටතේ වන අයදුම්කරුවන් අතුරින් පිළිවෙලින් ලිඛිත තරග විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගනු ලැබේ.

**සටහන :**

(01) I ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා) තනතුරේ ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව අනුව වසරකට වරක් ලිඛිත තරග විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(02) 11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා ලද නිලධාරීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

11.1 (අ) (ii) හි දැක්වෙන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා ලද නිලධාරියකු පුහුණුවෙන් අනතුරුව ඉහත 11.1(අ) හි දැක්වෙන තනතුරකට පත් කිරීමෙන් අනතුරුව සති දෙකක් තුළ අදාළ තනතුරේ සේවයට වාර්තා කළ යුතුය. එසේ තනතුර භාර නොගන්නා නිලධාරීන් හා පුහුණුව සාර්ථකව නිම නොකරන නිලධාරීන් ගිවිසුම්ගත මුදල ගෙවිය යුතු අතර ඔවුන් පෙර දැරූ තනතුරට පෙරලා යවනු ලැබේ.

**උපලේඛනය V**

| | | | |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨතාවය**<br><br>අධි ශ්‍රේණියේ සේවා කාලය සඳහා - වසරකට ලකුණු 05 බැගින්<br>I ශ්‍රේණියේ සේවා කාලය සඳහා - වසරකට ලකුණු 04 බැගින්<br>II ශ්‍රේණියේ සේවා කාලය සඳහා - වසරකට ලකුණු 03 බැගින් | | | උපරිම ලකුණු 80 |
| **කුසලතාවය** | | | උපරිම ලකුණු 20 |
| (i) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද උපාධියක් සඳහා | ලකුණු 05 | |
| (ii) | සෞඛ්‍ය ලේකම් විසින් පිළිගනු ලබන ආයතනයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබාගත් ඩිප්ලෝමාවක් සඳහා (මාස 06 කට හෝ පැය 720 කට නොඅඩු)<br>*සැලකිය යුතුයි:-*<br><br>මෙහි දී සූතිකා පුහුණු සහතිකයට හෝ මානසික හෙදකම පුහුණු සහතිකයට ලකුණු ලබා දෙනු නොලැබේ. | ලකුණු 03 | |
| (iii) | විශේෂ ක්‍රියාකාරකම්<br>ලකුණු ලබාදෙන විශේෂ ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.<br><br>1. විෂයානුබද්ධ පර්යේෂණ, නිබන්ධන හා පුවත්පත් සඟරා ආදියට සපයන ලද ලිපි - (උපරිම ලකුණු 02)<br><br>2. පුහුණු වැඩ සටහන් මෙහෙයවීම / සම්බන්ධීකරණ (උපරිම ලකුණු 02)<br><br>3. පුහුණු වැඩමුළු/සම්මන්ත්‍රණ (දේශීය/විදේශීය) සඳහා සහභාගිවීම - (උපරිම ලකුණු 02)<br><br>4. ප්‍රශංසා (පොදු 230 B ආකෘතිය අනුව වන ප්‍රශංසා සඳහා පමණක්) - (උපරිම ලකුණු 02) | ලකුණු 12 | |

| | | | |
|---|---|---|---|
| | 5. සුවිශේෂී සේවා සැපයීම - ස්වාභාවික /හදිසි/ත්‍රස්ත විපතේදී සේවා සැපයීම - (උපරිම ලකුණු 01)<br><br>6. තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ හැකියාව (උපරිම ලකුණු 02)<br><br>7. සිංහල /දෙමළ භාෂාව පිළිබඳ හැකියාව (සිංහල මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිළධාරීන්ට දෙමළ භාෂාවටද දෙමළ මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිළධාරීන්ට සිංහල භාෂාවටද ලකුණු ලබා දෙනු ඇත) (උපරිම ලකුණු 01)<br><br>(එක් සහතිකයකට/ලිපියකට/ප්‍රශංසාවකට ලකුණු 01 බැගින් ලබා දෙනු ලැබේ.) | | |
| | **එකතුව** | | **ලකුණු 100** |

08 - 130

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.